**ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව**

-----------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අප්‍රේල් 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ අයකරන ලද ණය පොලිය වූ රු.417,801 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ආදායම් නොවන ලැබීම් යටතේ සටහන් විය යුතු වුවද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ සටහන් කර තිබුණි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ලද පොලිය ආයෝජන ක්‍රියාකාරම් යටතේ ලැබීමක් ලෙස සටහන් කර ඇත. ලබා දෙන ණය හා අත්තිකාරම් අයකර ගැනීම් ද ඇතුලත් කල යුත්තේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහයන් වශයෙනි. එබැවින් ලද පොලිය ආයෝජන ක්‍රියාකාරකම් වශයෙන් සටහන් කිරීම නිවැරදි බවට විශ්වාස කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ලැබීම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය වූ ACA - 6 හි වටිනාකම භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA 82) හි අවසාන ශේෂයන් සමඟ සැසඳීමේදී එක් අයිතමයක රු. 564,562 ක් වැඩියෙන් ද අයිතම 3 ක එකතුව රු.564,560 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | භාණ්ඩාගාරයෙන් අප ගිණුම් වලත් ආරම්භක ශේෂ සමාන වේ. 2020.12.31 වන දිනට අදාලව 2021.01.25 නිකුත් කළ භාණ්ඩාගාරයේ වත්කම් වාර්තාවේ ශේෂ ජාතික පොලිස් කොමිෂන් සභාවේ වත්කම් වාර්තාවේ ශේෂ නිවැරදිව තිබුණි. එවා නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර ඇත. එහෙත් 2021.02.16 දිනැති | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | භාණ්ඩාගාරයේ SA 82 වාර්තාවේ 6112201 සංකේත අංකය 564561.67 වැඩි වී ඇති අතර 6112202, 6112204, 6112205 සංකේත අංක වලට රු.564,561.67 අඩුවෙන් දක්වා ඇත. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර එයට හේතුව මේ වන තෙක් අපවෙත දන්වා නැත. වෙනස් කිරීමට හේතුව හඳුනාගත නොහැකි අතර 2021.02.16 දිනැති SA 82 වාර්තාව නිවැරදි නොවේ. | |

### 1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

-----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා දැනටමත් සඵලදායී මූල්‍ය පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලැබේ. සෑම කාර්යයක්ම තවත් නිලධාරියෙකුගේ අධීක්ෂණයට යටත්වන පරිදි වැඩ බෙදීමක් සහතික කර ඇත. රජයේ ගිණුම්කරණය සඳහා පරිගණක පද්ධති 03 ක් ක්‍රියාත්මක කරන අතර ඒවා එකිනෙකට සම්බන්ධ නැති නිලධාරීන් විසින් මෙහෙයවන අතර අධීක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු විසින් අධීක්ෂණය කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයට අනුව 47 ව්‍යවස්ථාවේ 155 ඊ ඊ යටතේ කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තෙකුගෙන් ලැබෙන පැමිණිලි භාර ගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි බවට සඳහන් වුවද 2021 මාර්තු 28 දක්වා එම රීති සකස් කර නොතිබුණි. | පැමිණිලි භාරගැනීම හා විමර්ශණය කිරීම සඳහා වන කාර්ය පරිපාටිය සකස්කිරීමට බලාපොරොත්තුවන අතර ඒ සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාලව පනත් කෙටුම්පතක් මේවන විට සකස්කර එය අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත කොමිෂන් සභාවේ අනුමැතිය මත යවා ඇත. | 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නීති විරෝධී ලෙස රඳවා ගැනීම, බොරු චෝදනා කිරීම හා අල්ලස් දූෂණ පිළිබඳ පොලිස් නිලධාරීන්ට එරෙහි මහජන පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය සියයට 60 ට අඩු ප්‍රතිශතයක පැවතුණි. | 2020 වර්ෂයේදී කොවිඩ් 19 සෞඛ්‍ය නීතිරීති වලට අනුකූලව රාජකාරියෙහි නිරතවීමට සිදුවීම මත පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය සියයට 60 ට අඩුවුවත් 2021.02.28 දින වන විට එහි සාමාන්‍ය ප්‍රතිශතය සියයට 60 ඉක්මවා ඇත. විමර්ශන වලට අදාළ පොලිස් වාර්තා ප්‍රමාදවීම මත ද විමර්ශන කටයුතු නිම කිරීම ප්‍රමාද වී ඇත. | පොලිස් නිලධාරීන්ගේ සිදුවන වැරදි අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරනය හා පක්ෂග්‍රාහී වීම සම්බන්ධ පැමිණිලි ලැබීම පෙර වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද ලද පැමිණිලි වලින් සියයට 80 ඉක්මවා තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රමාණාත්මක වැඩි වීමක්ද තිබුණි. බලය අයථා ලෙස | ඉහත අංක 02 යටතේ දක්වා ඇති හේතු අනුව ඔබගේ නිරීක්ෂණයන් නිවැරදි වුවත් 2021.02.28 දින වනවිට පැමිණිලි විසඳීමේ ප්‍රතිශතයේ සාමාන්‍යය සියයට 80 දක්වා වැඩිවී ඇත. මෙම කාණ්ඩය යටතේ යොමු වන පැමිණිලි විමර්ශනය සඳහා විස්තරාත්මක තොරතුරු පැමිණිලිකරුගෙන්ම ලබාගතයුතු | කොමිෂමට ලැබෙන පැමිණිලි විභාග කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරිහරනය පිළිබඳ පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයේදී සියයට 77 ක් වූ නමුත් මෙම වර්ෂයේදී සියයට 68 දක්වා අඩුවී තිබුණි. එමෙන්ම පක්ෂග්‍රාහී වීම පිළිබඳ පැමිණිලි ලැබීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 92 කින් වර්ධනය වී තිබූ නමුත් පැමිණිලි විසඳීම සියයට 83 සිට 74 දක්වා අඩුවී තිබුණි. | අවස්ථා බොහෝවිට ඇත. එවැනි තොරතුරු ලැබීම ප්‍රමාදවීම මත ඊට අදාළ විමර්ශන සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. එබැවින් එවැනි විමර්ශන කටයුතු ප්‍රමාදවීමක් සිදුවේ. තවද පොලිස් වාර්තා ප්‍රමාදවීම මත ද විමර්ශන කටයුතු නිම කිරීම ප්‍රමාද වී ඇත. | |
| (ඇ) | බොරු චෝදනා කිරීම පිළිබඳ පැමිණිලි ලැබීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 120 කින් වැඩි වී තිබුණද පැමිණිලි විසඳීම සියයට 78 සිට සියයට 55 දක්වා අඩුවී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වයට අනුකූල වූ සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන්ට යටත් ව රාජකාරි ඉටුකරනු ලැබූ අතර මේ යටතේ ලැබී තිබූ පැමිණිලි 148 න් 99 ක් 2021.02.28 වන විට විමර්ශනය නිම කර ඇති අතර එහි සාමාන්‍යය සියයට 66 කි. මෙම කාණ්ඩය යටතේ යොමු වන පැමිණිලි විමර්ශනය කිරීමේදී වඩාත් පුළුල් පරාසයක් විමර්ශනය කිරීමට සිදුවන බැවින් ඊට අදාළ විමර්ශන සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. එබැවින් එවැනි විමර්ශන කටයුතු ප්‍රමාදවීමක් සිදුවේ. තවද පොලිස් වාර්තා ප්‍රමාදවීම මත ද විමර්ශන කටයුතු නිම කිරීම ප්‍රමාද වී ඇත. | කොමිෂමට ලැබෙන පැමිණිලි විභාග කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |
| (ඈ) | ප්‍රධාන කාර්යාලය වෙත ලද පැමිණිලි 120 න් විසඳීමේ ප්‍රතිශතය සියයට 47 ක තරම් අඩු මට්ටමක පැවතුණි. ඉකුත් වර්ෂයේදී පැමිණිලි 156 ක් ලැබී තිබූ අතර විසඳීමේ ප්‍රතිශතය සියයට 67 ක්ව පැවතුණි. | ප්‍රධාන කාර්යාලයේ සිදු කරනු ලැබුවේ වඩාත් සංකීර්ණ හා සහකාර පොලිස් අධිකාරිවරුන්ගේ සිට ඉහළ නිලධාරීන් සඳහා වූ පැමිණිලියි. එබැවින් ඒවා විමර්ශනය කිරීමට සාපේක්ෂව වැඩි කාලයක් ගතවේ. එසේම කොවිඩ් 19 වසංගත තත්වය යටතේ රාජකාරියෙහි නිරතවීමට සිදු වූ බැවින් අපේක්ෂිත කාර්යක්ෂමතාවයට ළඟාවිය නොහැකි වුවද 2021.02.28 වන විට ප්‍රධාන කාර්යාලය වෙත ලැබී තිබූ පැමිණිලි 120 න් 86 ක විමර්ශන කටයුතු අවසන් කර තිබිණි. ඒ අනුව විසඳීමේ ප්‍රතිශතය සියයට 71 ඉක්මවා ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මධ්‍යම හා සබරගමුව පළාත් කාර්යාල වෙත ලැබී තිබූ පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය පෙර වර්ෂයේදී සියයට 81 මට්ටමේ පැවතියද මෙම වර්ෂයේදී පිළිවෙලින් සියයට 58 හා සියයට 57 දක්වා පහත වැටී තිබුණි. | පැවති වසංගත තත්වය යටතේ මෙම පළාත්වල සංචරණ සීමා පැණවීම්වලට යටත්වීම, පොලිස් නිලධාරින් වසංගත තත්වයන් පාලනය කිරීමට මෙන්ම මැතිවරණ රාජකාරිවලට යෙදවීම නිසා පොලිස් වාර්තා ලබාගැනීම ප්‍රමාදවීම යනාදි හේතුවලට මුහුණදෙමින් වුවද 2021.02.28 දින වන විට මධ්‍යම පළාතට ලැබී තිබූ පැමිණිලි 183 න් 141 විමර්ශනය කර අවසන් කර ඇති අතර එය සියයට 77 ක ප්‍රතිශතයකි. සබරගමුව පලාතට අදාළව පැමිණිලි 145 ක් ලැබ් තිබූ අතර ඉන් 98 ක විමර්ශන කටයුතු අවසන් කළ අතර විමර්ශන නිම කිරීමේ ප්‍රතිශතය සියයට 67 කි. | කොමිෂමට ලැබෙන පැමිණිලි විභාග කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |

## 3. යහපාලනය

### 3.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන පැමිණිලි විමර්ශනයේදී අදාල පොලිස් නිලධාරීන් කැඳවා විමර්ශනය කිරීම හෝ අදාල පොලිස් ස්ථානවලට ගොස් විමර්ශනය කිරීමට වඩා පොලිසියෙන් කැඳවන වාර්තා පදනම්කර ගෙන විමර්ශන සිදුකර ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | පසුගිය වසරෙහි වැඩි වශයෙන් විමර්ශන කටයුතු පොලිසියෙන් කැඳවන වාර්තා පදනම් කරගෙන සිදු කළේ ද ඉහත 2.2 හි සඳහන් කරුණු හේතුවෙන්ම බව තවදුරටත් කාරුණිකව සඳහන් කරමි. | මහජන පැමිණිලි විමර්ශනයේදී පොලිස් නිලධාරීන් කොමිෂමට කැඳවා විමර්ශනය හෝ පොලිස් ස්ථානවලට ගොස් විමර්ශනයක් කළ යුතුය. |
| (ආ) | පළාත් කාර්යාල වෙත ලැබෙන පැමිණිලි කාර්යක්ෂම ලෙස විමර්ශනය සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම්, ප්‍රවාහන පහසුකම් වැනි යටිතල පහසුකම් නොමැතිවීම බාධාවක් වී තිබුණි. | පළාත් කාර්යාල සඳහා ප්‍රමාණවත් කාර්යාල පහසුකම් සඳහා එම ප්‍රදේශවල රජයේ ගොඩනැගිලි ලබාගැනීම දුෂ්කර වී ඇත. එහෙත් එම ප්‍රදේශ වලින් පෞද්ගලික ගොඩනැගිලි ලබාගත හැකිද යන්න සහ එවැනි ගොඩනැගිලි හඳුනාගැනීමට කටයුතු කරන ලෙස | පළාත් කාර්යාලවලට ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |

| | | |
|---|---|---|
| | පළාත් අධ්‍යක්ෂවරුන්ට දන්වා ඇත. එසේම පළාත් කාර්යාලවල නිලධාරින් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදීමට පවතින තත්වය යටතේ හැකියාවක් නොමැති අතර ඉදිරියේදී කිසියම් වැඩපිළිවෙලක් යෙදවීමට ඇති හැකියාව සොයා බැලීමට බලාපොරොත්තු වේ. | |

**3.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් පවතී. අභ්‍යන්තර විගණන අංශයක් ඇතිකිරීම සඳහා විගණන නිලධාරියෙකු බඳවා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු සඳහා තනතුරක් ඇතිකර ඇති අතර නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙස රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 25 ක් පුරප්පාඩුව පැවතීම මත කොමිෂමේ කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. | සමහර තනතුරුවල පුරප්පාඩු සඳහා නිලධාරින් පත්වීම් බලධාරීන් විසින් ලබා නොදීම නිසාත්, 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය අනුව මෙම කොමිෂන් සභාවේ කාර්ය භාරය සීමා වීම හේතුවෙන් කොන්ත්‍රාත් පදනම මත සේවය කල නිලධාරින්ගේ සේවා කාලය අවසන් කිරිම හා ස්ථිර | කාර්ය භාරයට ගැලපෙන ආකාරයට අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සේවයේ නියුතු නිලධාරීන් වෙනත් සේවාවලට මාරු වී යාම නිසා අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 25 ක් පුරප්පාඩුව පවතී. | |
| (ආ) | බස්නාහිර පළාත හැර සෙසු පළාත් 08 හි නිලධාරීන් 16 ක් පමණක් සේවය කරන අතර පළාත් අධ්‍යක්ෂවරු (කොන්ත්‍රාත්) 08 දෙනාට අමතරව විමර්ශන නිලධාරීන් 05 ක් සංවර්ධන නිලධාරීන් 02 ක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් එක් අයෙක් විය. පළාත් කාර්යාල වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා පළපුරුදු විමර්ශන කණ්ඩායම් එම කාර්යාලවල සේවයේ සිටිය යුතු නමුත් එසේ සිදුවී නොතිබුණි. | සෑම පළාත් කාර්යාලයකටම පලාත් අධ්‍යක්ෂවරයෙකු පමණක් අනුයුක්ත කර ඇත. ඉදිරියේදී තවත් නිලධාරියෙක් අනුයුක්ත කිරිම සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගෙන් අනුමැති ලබාගෙන ඇත. පළාත් කාර්යාල වලට ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය පිළිබඳ නිලධාරීන් පුහුණුවීම් ලබා දී ඇති අතර ඉදිරියේදී ද පුහුණුවීම් ලබා දීමට කටයුතු කරගෙන යනු ලැබේ. | පළාත් කාර්යාල සඳහා අත්‍යවශ්‍ය වන්නේ නම් විමර්ශන නිලධාරීන් අනුයුක්ත කළ යුතු වීම. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම්කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සැලස්මක් පිළියෙල කර ක්‍රියාත්මකකර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව ඉදිරියේදී කටයුතු කිරිමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වීම |